කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය - දකුණු පළාත
முகாமைத்துவ அபிவிருத்தி பயிற்சி நிலையம் - தென் மாகாணம்
Management Development & Training Institute - Southern Province
වක්වැල්ල, ගාල්ල. வக்வெள்ள,காலி. Wakwella, Galle.

MDTI SP
Success through the Management and Development

මගේ අංකය. / எனது இல. / My No. } MDTI-SP/TU/01/08
ඔබේ අංකය. / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2025.03.18

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සියලුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**ආයතනගත හා බාහිර පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.**

දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය මගින් 2025 වර්ෂය සඳහා සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබා දෙමින් නිකුත් කරන ලද **2025.03.14 දිනැති ප්‍රධාන ලේකම් පුහුණු චක්‍රලේඛ අංක 01/2025** වෙත ඔබගේ අවධානය යොමු කරවමි. එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ඒ අනුව, 2025 වර්ෂය සඳහා පුහුණුලාභීන් ලියාපදිංචි කිරීමක් සිදු නොකරන අතර, ආයතනයේ හෝ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා අනුව පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ පුහුණු සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කරන ලෙසත් ඉහත චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාර ව කටයුතු කරන ලෙසත් කාරුණික ව දන්වා සිටිමි.

03. තවද, දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය මගින් 2025 වර්ෂයට අදාළ ව සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයන් ලියාපදිංචි කිරීම 2025.03.31 දිනට පෙර සිදු කළ යුතු වේ. සම්පත්දායකයෙකු ලෙස ලියාපදිංචි වීමට කැමති යම් නිලධාරියෙකු සිටීනම්, එම නිලධාරීන් හට සම්පත්දායකයන් ලෙස ලියාපදිංචි වීමේ අවස්ථාව පවතින අතර, නිසි පරිදි නිවැරදිව සම්පූර්ණ කරන ලද සම්පත්දායක අයදුම්පත්‍රය අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි සමඟ 2025.03.31 දිනට පෙර දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

**ජී.පී.ජී.රොෂාන් අමරසිංහ**
**අධ්‍යක්ෂ,**
**කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය,**
**දකුණු පළාත.**

අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director } 091 2 235386
සහකාර අධ්‍යක්ෂ / உதவிப் பணிப்பாளர் / Assistant Director } 091 4 944023
www.mdtisp.lk
mdtisp@hotmail.com
කාර්යාලය / அலுவலகம் / Office } 091 2 246716 091 4 944190
ෆැක්ස් / தொலை நகல் / Fax } 091 2 246716 091 2 243280
පුහුණු අංශය / பயிற்சிக் கூடம் / Training Unit } 091 3 907135 091 4 944021
Follow Us:
https://www.facebook.com/Management-Development-Training-Institute-Southern-Province-535188489903524/
https://twitter.com/MDTI_sp